www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ලෙබනනය මුලිනුපුටා දැමීම සඳහා එක්සත් ජනපද ඊශ්‍රායල යුද එල්ලය

## US-Israeli war aim is to annihilate Lebanon

**කර්තෘ මන්ඩලය විසිනි**
**2006 අගෝස්තු 05**

පසු ගිය සිකුරාදා වන විට ලෙබනනයට එරෙහිව තියුනු ලෙස ඉහල දමුනු ප්‍රහාරයන් නිරවද්‍ය ලෙසින්ම පැහැදිලි කරනු ලැබුවේ. එක්සත් ජනපද ඊශ්‍රායල යුද ප්‍රචන්ඩත්වයේ එල්ලය වන්නේ ස්වාධීන හා ස්වෛරී රටක් ලෙස ලෙබනනයේ පැවැත්ම සුන් කර දැමීම බවයි.

එක්සත් ජනපදය හා ඊශ්‍රායලය මගින් පාලනය කෙරෙන අත්පත් කර ගැනුනු ප්‍රදේශයක් බවට රට පරිවර්තනය කිරීම යුද්ධයේ එල්ලය යි. සමහර විට පාලන මාධ්‍යය වනු ඇත්තේ නැටෝ "සාම සාධක" හමුදා විය හැකියි. පැහැදිලි වුවමනාවකින් යුතුව ලෙබනනය විනාශ කරමින් සිටින්නේ අතිශයින්ම නිශ්චිත සැලසුම් සහිතව ය. ඊශ්‍රායලය සම්බන්ධයෙන් ගත් විට එය තව දුරටත් වඩ වඩාත් භූමි ප්‍රදේශ යා කර ගැනීමකි. වොෂින්ටනය සම්බන්ධයෙන් ගත් විට එය ප්‍රථම කොට ම සිරියාවට හා ඉරානයට එල්ල කෙරුනු නව වඩාත් ලේ වැකි ආක්‍රමනයන් සූදානම් කිරීමයි.

මෙම යුද්ධය එල්ල කරමින් සිටින්නේ ඊශ්‍රායලය ත්‍රස්තවාදයෙන් ආරක්ෂා කිරීමට හෝ ෂියායිට් හෙස්බොල්ලා ව්‍යාපාරය විනාශ කිරීමටය යන මවා පෑම, දකුනු ලෙබනනයේ හා බීරුට්හි දකුනු නාගරික ප්‍රදේශයන්හි ෂියායිට් මධ්‍යස්ථානයන්ගෙන් බොහෝ දුරස්ව පවතින එල්ලයන්ට පහර දෙමින් පීඩාවට පත් කරන්නා වූ ඊශ්‍රායල බෝම්බ ප්‍රහාර මගින් සාවද්‍ය කෙරී තිබේ. යුද්ධය ඇරඹීමෙන් පසු සිදු කෙරුනු එක් දරුනුතම ව්‍යසනයක් වූයේ ඈත උතුරේ සිරියානු දේශ සීමාව අසල බෙකා බැවුමේ ප්ලම් සහ පීචස් ට්‍රක්රථවලට පටවමින් සිටි ගොවිපල කම්කරුවන් 33ක් කීතු කරමින් එල්ල වුනු ඊශ්‍රායල ගුවන් ප්‍රහාරයයි. අවම වසයෙන් තවත් 20ක් ප්‍රහාරයෙන් තුවාල ලැබූහ. ගොදුරු වූවන් බොහෝමයක් සිරියානු කුර්ද්වරු වූහ. ඉහත බෝම්බ ප්‍රහාරයන් මගින් ලෙබනනය තුල වූ ආරෝග්‍යශාලාවන්ට ගමන් කරන මාර්ග විනාශ කර තිබූ බැවින් මොවුන්ව දේශ සීමාව හරහා සිරියානු රෝහල්වලට ගෙන යනු ලැබිනි.

මෙම ගොවිපල කම්කරුවන්ගේ ඝාතනයෙන් පසුව දකුනු ලෙබනනය හා බීරුට්, රටෙහි උතුරු බාගයට සම්බන්ධ කරන්නා වූ ප්‍රධාන මුහුදු බඩ මාර්ගයේ පාලම් ක්‍රමානුකූලව විනාශ කිරීමට ගුවන් ප්‍රහාර එල්ල විය. ක්‍රිස්තියානුවන් බහුතරයක් වෙසෙන උතුරට එල්ල කෙරුනු මෙම පලමු ප්‍රධාන ප්‍රහාරයන් විදේශික සහන සැපයුම් ප්‍රවාහනයට ඉතිරිව පැවති එකම ජීවත අපේක්ෂාවේ මාර්ගයද කපා දමා රට දෙකට කපා දැමී ය. උදෑසන රැකියාවන්ට ගමන් කරන කාලය තුල දී එල්ල වුනු මෙම බොම්බ ප්‍රහාරය මගින් අවම වසයෙන් පස් දෙනෙකු ජීවිතක්ෂයට පත් විය. පාලම්වලට යටින් එල්ල වූ බෝම්බ නිසා සිරවීමෙන් මිය ගිය මෝටර්රථවල ගමන් ගත්තවුන් ද මීට අයත් ය.

මිලිටරි මෙහෙයුම්වලින් ආරක්ෂාව පතා පැමිනි සිවිල් වැසියන් සිටි නිවාස දෙකක් ඊශ්‍රායල ගුවන් ප්‍රහාර මගින් විනාශ වීමෙන් දකුනු ලෙබනනයේ ඊශ්‍රායල දේශ සීමාව අසල තවත් සංත්‍රාසයක් පසු ගිය සිකුරාදා වාර්තා කෙරිනි. ලෙබනන නිලධාරීන්ට අනුව සුන් බුන්වලට යට වී 57ක් ජනයා සිටි අතර මිය ගිය ගනන හා දිවි ගලවා ගත්තවුන්ගේ ගනන දැන ගන්නට නැත.

මේ අතර තුර නිවාස ගොඩනැගිලි, මාර්ග පද්ධති හා අනෙකුත් ව්‍යුහයන් විනාශ කරමින් ඊශ්‍රායල යුද ගුවන්යානා දකුනු බීරුට්හි ෂියායිට් නිවාස ප්‍රදේශවලට බෝම්බ දැමීම යලි ඇරඹී ය. ජනාකීර්න නාගරික දිස්ත්‍රික්කවල නිවැසි සියල්ලටම තම දිවි ගලවා ගැනීමට ඉවත් වන ලෙස විධාන දෙන පත්‍රිකා ගුවන් යානා මගින් පතිත කෙරිනි.

ඊශ්‍රායල ප්‍රහාරවලින් ආසන්න වසයෙන් සති හතරකට පසුව, මැලේසියාවේ කැඳවුන ඉස්ලාමික සම්මේලන සංවිධානයේ හදිසි සැසිය වෙත විකාශනය කල කතාවේ දී ලෙබනනයේ අගමැති ෆුඩ් සිනිඕරා ප්‍රකාශ කලේ ලෙබනනය තුල සිවිල් වැසියන් 900ක් මරනයට පත් වී ඇති අතර 3000ක් තුවාල ලබා ජනගහනයෙන් හතරෙන් එකක ප්‍රමානයක් එනම් දශ ලක්ෂයකට අධික ප්‍රමානයක් අභ්‍යන්තර සරනාගතයින් බවට පත්ව ඇති බවයි. මරනයට පත්ව ඇති ප්‍රමානයෙන් තුනෙන් එකක් වයස අවුරුදු 12ට අඩු ළමයින් බව ඔහු පැවසී ය.

රටෙහි එක් කොටසක් අනිත් කොටසින් වෙන් කරන අතර තුර ලෙබනනය පිටස්තර ලෝකයෙන් වෙන් කිරීමේ ඊස්රායල් උද්ඝෝෂනය මගින් එහි සිවිල් ජනතාව මත පතිත කරන ෂෙල් හා බෝම්බවලින් සිදු කෙරෙන මරනයන්ට වඩා වැඩි මරන සංඛ්‍යාවකට මග පෑදෙනු ඇත.

ජුලි මැද සිට ලෙබනනයට එරෙහිව ගුවන් හා මුහුදු බාධක ඊස්රායලය විසින් පනවනු ලැබ ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස රට අඳුරේ ගිල්වීමට තර්ජනය කෙරෙන අයුරින් ඉන්ධන සැපයුම් අතිශයින්ම පහත වැටී තිබේ. ඊස්රායල යුද නැව් විසින් ඉන්ධන නැව් හරවා යවනු ලැබ තිබේ. අතිශයින්ම ව්‍යසනකාරී බලපෑම වන්නේ 1970 ගනන්වල සිවිල් යුද්ධයේ දී විවෘතව පැවති රෝහල් ද ඇතුලුව ප්‍රධාන රෝහල් වසා දැමීමට තුඩු දෙන ඉන්ධන හා වෙනත් හිඟයන් මෙන් ම කාර්යමන්ඩලයට සේවයට වාර්තා කල නොහැකි තත්වයක් පැවැතීම යි. බාධකයන්ගේ ප්‍රතිඵලයක් ලෙස අසාධ්‍ය රෝගීන් මරනයට පත් විය හැකි යයි සෞඛ්‍ය සේවකයෝ අනතුරු හඟවති.

බීරූට් පුරාත් රටෙහි ඉතිරි කොටසේත් විදුලි බලය ඇන හිටීම සාමාන්‍ය කරුනක් වී ඇති අතර සමහර ප්‍රදේශවලට දිනකට විදුලි බලය ලැබෙන්නේ පැය දෙකක් පමනි. එමෙන්ම වෙලඳ සැල්වල අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය හිඟ වෙමින් තිබේ.

ලෙබනන ජනයාට එරෙහිව "කුසගිනි යුද්ධයක්" දියත් කිරීම පිලිබඳව ඊස්රායලයට චෝදනා කරමින් ලෙබනන ජනාධිපති එමිල් ලහුඩ් ප්‍රකාශයක් නිකුත් කලේ ය. "එය ඊස්රායලයේ ප්‍රකාශිත අරමුනු අබිබවන ප්‍රචන්ඩත්වයක්" බව ඔහු පැවසී ය.

සිකුරාදා බෝම්බ දැමීම මගින් රටෙහි උතුර දකුන යා කරන මූලික පාලම් බිඳ දැමීමේ ප්‍රතිඵලය වන්නේ රට තුලට ආධාර ගෙන ඒමට පැවති අවසාන මාර්ගය ද කපා දැමීම මගින් විනාශය තීව්‍ර කිරීම යි.

ලෙබනන ජනතාව පීඩාවෙන් මුදාගැනීමේ ඕනෑ ම උත්සාහයක් වුවමනාවෙන්ම කඩාකප්පල් කිරීම තර්ජනය කරන්නේ ව්‍යසනකාරී ප්‍රතිඵලයන්ට ය. යටිතල ව්‍යුහයේ විනාශය හා ඉන්ධන සැපයුම් කපා හැරීම නිසා පානීය ජලයට විෂ රසායනික ද්‍රව්‍ය එකතු වුව හොත් දකුනු ලෙබනනයේ හා විශේෂයෙන් ම එහි අවතැන් වූ ජනයා මරනීය ව්‍යසනයන්ට ගොදුරු විය හැකි බවට එක්සත් ජාතීන්ගේ ලමා අරමුදල අනතුරු ඇඟවී ය.

ලහුඩ්ගේ ප්‍රකාශය ලෙබනනයට එල්ලවන ම්ලේච්ඡ ඊස්රායල ප්‍රහාර පිලිබඳව ද හුදු හැඟීම්බර හෙලාදැකීමක් නොව, මෙම යුද්ධයේ යථා එල්ලයන් පිලිබඳ නිවැරදි තක්සේරුවකි.

වොෂින්ටනයේ බුෂ් පරිපාලනය හා ඊස්රායලයේ අගමැති එහුඩ් ඕල්මට්ගේ ආන්ඩුව විසින් දියත් කරනු ලැබ ඇති යුද්ධයේ එල්ලය වන්නේ, මහජන ත්‍රස්තය යොදා ගනිමින් සමස්ත ජනතාවන්ම පලවා හරිමින් හා සමස්තයක් ලෙස ජාතිය, වොෂින්ටනයේ හා සියොන්වාදී තන්ත්‍රයේ වුවමනාවන්ට පූර්න ලෙස යටත් කෙරුනු, අර්ධ-යටත් විජිත වැයික්කියක් බවට පත් කරමින් ලෙබනනය රටක් ලෙස විනාශ කර දැමීම ය.

## යාකර ගැනීම සහ "තන්ත්‍රය වෙනස් කිරීම"

ලෙබනන ජනයාට එරෙහිව යොදා ගනු ලබන ම්ලේච්ඡ ක්‍රම මගින් යුද්ධ එල්ලයන් පැන නැගේ. ඊස්රායලය සම්බන්ධයෙන් ගත් විට පෙනෙන්ට ඇති සමීපතම එල්ලය වන්නේ ජනඝාතනයන් හා ත්‍රස්තය යොදා සිවිල් ජනයා හිස් කිරීමෙන් පසු ලෙබනන දේශයේ සැලකියයුතු කොටසක් යා කර ගැනීම යි. දේශ සීමාවෙන් උතුරට සැතපුම් 15ක් දුරින් පිහිටි ලිටනි නදිය කරා ගමන් කිරීමට සූදානම් වන ලෙස ඊස්රායල් ආරක්ෂක ඇමති අමීර් පෙරෙස් මිලිටරියට විධාන දී තිබේ. මෙම නදියේ පාලනය අත් පත් කර ගැනීම ඊස්රායල රාජ්‍ය ඇති කිරීමටත් පෙර සිට ම සියොන්වාදී මූලෝපායික එල්ලයක් ලෙස පැවතිනි.

පසු ගිය වසර 40ක අත්දැකීම ප්‍රදර්ශනය කරන්නේ ඊස්රායලය නිශ්චිත සීමාවන් නොමැති රාජ්‍යයක් බවයි. සෑම නව යුද්ධයකම ගතිකය එහි ප්‍රකාශිත ආරක්ෂක අවශ්‍යතා ඉටු කර ගැනීමට අවශ්‍ය අයුරින් නව භූමිභාගයක් වෙත බලය පතුරුවා පුලුල් කර ගැනීමයි. ලෙබනනය තුල ඊස්රායල් රාජ්‍ය ගෙන යන පිලිවෙත සමාන වන්නේ හිට්ලර්ගේ තෙවන රීච්යේ " ලෙබනස්රූම්" පිලිවෙතට ය. ඉන් කෙරුනේ ඔවුන්ගේ භූමිභාගයන් යලි ජනාවාස කිරීම සඳහා පහත් යැයි සැලකුනු ජනයා ඝාතනය කර දැමීම හෝ පන්නා දැමීම යි.

වොෂින්ටනය සම්බන්ධයෙන් ගත්විට ඊස්රායල ප්‍රහාරයට බොහෝ පුලුල් වැදගත් කමක් තිබේ. ලෙබනනයට අත් කර දෙන විනාශය සලකනු ලබන්නේ සිරියාව හා ඉරානය තුල "තන්ත්‍රයන් වෙනස් කිරීම" එල්ල කර ගැනෙන නව ප්‍රචන්ඩ යුද්ධ දියත් කිරීම සඳහා වූ මුල් පියවරක් ලෙසයි. ලෙබනන ජනයාට එරෙහි ඊස්රායලයේ සාපරාධී යුද්ධයට එක්සත් ජනපදය කොන්දේසි විරහිතව සහයෝගය දීම මූලධර්මාත්මකව රඳා ඇත්තේ මැද පෙරදිග හා එහි තෙල් ධනය මත අනභියෝගී ලෙස ආධිපත්‍ය තහවුරු කර ගැනීමේ එක්සත් ජනපදයේ මූලෝපායික එල්ලය මත ය.

පසු ගිය වසරේ ඊනියා "සෙඩාර් විප්ලවයට" එක්සත් ජනපදය සහාය දෙනු ලැබුවේ නිසැකවම මෙම එල්ලය මත ය. මෙම සිදුවීම හා ඊට පසුව පැවති මැතිවරනය හෙස්බුල්ලා සංවිධානයේ දේශපාලන බලපෑම ශක්තිමත්

කිරීමට තුඩු දීම වොෂින්ටනය විසින් දකිනු ලැබුවේ ජන ඝාතක මිලිටරි බලයක් යෙදීම මගින් විසඳා ගත හැකි තම එල්ලයන් සඳහා පවතින නොඉවසිය හැකි බාධකයක් ලෙස ය.

බුෂ් පරිපාලනයේ මැද පෙරදිග මිලිටරිවාදී ප්‍රතිපත්තිය වඩාත් ස්ථිරසාරව ඉටු කරන වොෂින්ටන් පෝස්ට් පුවත්පතෙහි චාල්ස් ක්‍රව්තැමර්ගේ සිකුරාදා පල කල තීරුව තුල එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ නිරුවත් එල්ලයන්ට ප්‍රකාශනයක් ලබා දෙයි. ඊස්රායලයට සිය ආරක්ෂාව සලසා ගැනීමට එක්සත් ජනපද කොල එලිය විහිදු වීම ඊස්රායලයට ලබා දුන් අනුග්‍රහයක් ලෙස සලකනු ලබතැයි ඔහු ලීවේ ය.

"නමුත් එය ප්‍රවනතාත්මක, නොමග යවන සුලු, පක්ෂපාතී විශ්ලේෂනයකි. කොල සංඥාව ඇත්ත වසයෙන්ම පිටුබලයක් වූ අතර එය ඇමරිකාවට අවශ්‍ය පිරිසිදු ස්වයං-වුවමනාවද වෙයි. හෙස්බුල්ලා සංවිධානය තීරනාත්මක ලෙස පරාජය කිරීම ඇමරිකාවට අවශ්‍ය ය."

ක්‍රවුතැමර් ඊස්රායලය විවේචනය කලේ ලෙබනන් වැසියන්ට එරෙහි එහි යුද්ධයේ ජනඝාතන ස්වරූපය පිලිබඳව නොව මීට වඩා දැවැන්ත බලයක් යොදා ගැනීමට ඊස්රායලය අසමත් වීම පිලිබඳව ය. ඊස්රායලයට මෙම කටයුත්ත කලහැකි යයි වොෂින්ටනය ගනන් බැලූ බව ඔහු ලීවේ ය. ඊට සෑහීමට පත් විය නොහැකි ය. අගමැති ඕල්මට් අස්ථිර හා අපැහැදිලි නායකත්වයක් සැපයී ය. මුග්ධ ලෙස ගුවන් බලය මත පමනක් විශ්වාසය තබමින් ඔහුගේ ජනරාල්වරුන්ට අවශ්‍ය වූ අයුරින් භෞමික ප්‍රහාරයන් සඳහා ඉඩ නොදුන් ඔහු හට පසුව වෙනස් වීමට සිදු විය.

බුෂ් පරිපාලනය තුල පවතින යථා මනෝගතීන් ඒවා ය. ලෙබනනය තුල බහුජන ඝාතනයන්ගේ ව්‍යාපාරයන් ඇති තරමින් දස දහස් ගනන් නොවේ නම් සිය දහස් ගනනක් ගොදුරු කර හෝ එක්සත් ජනපද එල්ලයන් සපුරා ගැනීම ඊට අවශ්‍ය ය.

මෙම මූලෝපායේ කෲරත්වය මැද පෙරදිග පුරා දැවැන්ත නැගිටීම් ඇති කරන බව අවිවාදිත ය. ඉන් බොහොමයක් එල්ල වන්නේ මෙම ලේ වැකි ක්‍රියාවලියේ සැලසුම් සහ සහයෝගය දීම් පිලිබඳ ඇමරිකානු ක්‍රියාකලාපයේ අතිශය කුහක බව හා සාපරාධිත්වය කෙරෙහි ය. වැඩි කාලයක් ගෙවීයාමට පෙර වොෂින්ටන හා ඇමරිකානු නිල ජනමාධ්‍ය විසින් කොසෝවෝහි දැවැන්ත උද්ඝෝෂනයක් ඇති කර බෝල්කන් යුද්ධයට පූර්ව සූදානමක් ලෙස කොසෝවෝහි "වාර්ගික ශුද්ධය" පැන නැගීමට සැලැස්වී ය.

දකුනු ලෙබනනයේ සමස්ත ෂියායිට් ජනගහනය, සිවිල් ප්‍රදේශවලට දමන අතොරක් නැති බෝම්බ ප්‍රහාර මගින් වේගයෙන් ශුද්ධ කිරීමේ ක්‍රියාවලිය පහසු කිරීම සඳහා දුන් එම බෝම්බ හා මිසයිල කඩිමුඩියේ ලබා දෙමින් සිටියි.

ලෙබනනයේ පවතින යුද්ධය සම්බන්ධව ඊස්රායලය හා එක්සත් ජනපදය හෙලා දකිමින් එක්සත් ජනපද ආක්‍රමනයට එරෙහිව සටන් වැදීමට සපථ කරමින් පසු ගිය සිකුරාදා 100,000ට අධික පිරිසක් බැග්ඩෑඩ්හි සාදර් නගරයේ ෂියායිට්වරු බහුතරයක් වසන පෙදෙසේ පෙලපාලි දැක්වූහ. ජෝර්දානය හා ඊජිප්තුව වැනි රටවල දක්ෂිනාංශික අරාබි තන්ත්‍රයන් හට වොෂින්ටනයෙන් ඈත් වීමට බල කෙරී ඇත.

*ඩේලි ස්ටාර් බීරූට්* පුවත්පත සිකුරාදා සිය කතුවැකියෙන් අනතුරු ඇඟවූයේ "යුද්ධය විසින් සමහර විට බහුතරයක් වූ, දැවැන්ත මහජන කොටස්වල මහජන මතය තම ආන්ඩුවලම ප්‍රතිපත්තිවලට එරෙහිව කුපිත කරවන බවයි.

"ලෝකයේ බල ශක්ති සංචිතයන් විශාල වසයෙන් පවතින්නා වූ හා ආන්ඩු හා සාමාන්‍ය වැසියන් තම එල්ලයන් ජයගැනීමට අතිශයින් දරුනු ප්‍රචන්ඩත්වය යොදා ගනු ලබන ප්‍රදේශයක, මෙහි ප්‍රතිඵලයන් භයංකර විය හැකි ය. ලෙබනනය හා ඊස්රායලය අතර යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙස අරාබි රටවල් ගනනාවක පැතිර යමින් පවතින රැඩිකලීකරනයේ ලක්ෂනයන් නොතකා හැරිය යුතු නැතැ"යි එය පැවසී ය.

මෙම පැහැදිලි උපදේශයන්ට බුෂ් පරිපාලනය අවධානය නොදෙන බව පෙනේ. ඉරාකය තුල විනාශකාරී වගුරකට රට ඇද දමා ඇති එය සිය " ත්‍රස්තවාදයට එරෙහි ගෝලීය යුද්ධයේ" හීනවන ප්‍රානවත් බව යලි නංවා ගැනීම සඳහා මාධ්‍යයක් ලෙස නව ත්‍රස්තවාදී ප්‍රහාර හා නව යුද්ධවලට සාදරයෙන් ඇරයුම් කරයි.

ඊස්රායල හා වොෂින්ටන් පිලිවෙත්වලට එරෙහිව වැඩෙන බහුජන විරුද්ධත්වය "ත්‍රස්තවාදයට" පවරන අතර නව හා වඩාත් දරුනු යුද්ධ සඳහා පූර්ව නිමිති සොයා ගනු ඇත.

වොෂින්ටනයේ නාමික විරුද්ධ පක්ෂය මේ අතර පරිපාලනය සමඟ ඔට්ටු වන්නේ ලෙබනනය මත ඊස්රායල යුද්ධයේ වඩාත් ලැදි සහයෝගකරුවා බවට පත් වීමට ය.

මෙම පක්ෂයේ නියෝජිත හිලරි ක්ලින්ටන් නිව් යෝර්ක් හි ඩිමොක්‍රටික් සෙනේට් සභිකාවක් වන අතර 2006 ජනාධිපති වරනයේ ප්‍රධාන නියෝජිතවරයෙකු වේ.

කානා ග්‍රාමයෙහි ළමයින් බහුතරයක් සමග විශාල පිරිසක් ඝාතනය වීමෙන් දින කිහිපයකට පසුව පසු ගිය අඟහරුවාදා නිව් යෝර්ක් හි බෆලෝහිදී කතා කරමින් හිලරි ක්ලින්ටන් ඇගේ කොන්දේසි විරහිත පිටුබලය ඊස්රායල රජයට ලබා දුන්නා ය. ඇය මෙසේ පැවසුවා යඃ "ඊස්රායලය ආරක්ෂා කිරීමේ පෙරමුන එක්සත් ජනපදය ගත යුතු ය. එය ඊස්රායලයේ ආරක්ෂාව තහවුරු කල යුතු ය.... ඉන් අදහස් වන්නේ හමුදා තව වැඩි කල යුතු ද යන්න යැයි මම නොදනිමි.

ලේ වැගිරෙමින් සිටින ලෙබනන ජනතාව පිලිබඳව උනන්දුව හෝ අනුකම්පාව දනවන වචනයක් වත් ක්ලින්ටන්ගේ තොල් අතරින් පිට නොවී ය. මෙම ආකල්පය අමුතු දෙයක් නොව, සමස්ත ඇමරිකානු දේශපාලන සංස්ථාපිතයේ හා ජන මාධ්‍යයන්ගේ නීතිය යි.

ඉතියෝපියා, ගුඅර්නිකා, පෝලන්තයට එරෙහි බ්ලිට්ස්ක්රිග් ආදි 1930 ගනන්වල ජර්මානු හා ඉතාලි ෆැසිස්ට්වාදී අපරාධයන් සිහි ගන්වන, මෙම අපරාධයන්ට සලකනු ලබන්නේ ඊස්රායලයේ "ආත්මාරක්ෂාව" සඳහා සිදු කෙරුනු තේරුම් ගත හැකි හා පිලිගත හැකි ක්‍රියාවන් වසයෙනි.

මෙලෙස සදාචාරය අන්තයටම පිරිහීම පිටුපස පවතින්නේ මිලිටරිවාදය දිගට ම යොදා ගැනීම හරහා එහි ගෝලීය වුවමනාවන් හොඳින්ම ඉටුකර ගත හැකි බව සලකන ඇමරිකාවේ පාලක කතිපයාධිකාරයේ පන්ති වුවමනාවන් ය.

අවසානයේ දී, උන්මත්තක ක්‍රියා මාර්ගයන් සේ පෙනෙන මේවාට ගෙවීමට බල කෙරෙන්නේ ඇමරිකානු කම්කරු ජනයාටම වේ. ජීවන මට්ටම් හා රට තුල කම්කරු ජනයා සඳහා යන්තමින් හෝ ඉතිරිව තිබෙන සමාජ සේවාවන් විනාශ කිරීම තුල එක්සත් ජනපද මිලිටරිවාදයේ වියදම වැඩි වැඩියෙන් දැනේ.

තව දුරටත්, මිලිටරි සේවය අනිවාර්ය කිරීමෙන් තොරව මැද පෙරදිග දිගින් දිගටම පුලුල් වන්නාවූ යුද්ධය එතරම් කලක් දරා ගත නොහැකි වනු ඇත. 2006 වාර මැද මැතිවරන අවසන් වූ පසුව, නිසැකවම ඩිමොක්‍රටිකයින් විසින් මූලිකත්වය ගනිමින්, ඇමරිකානු තරුන ජනයා මිලිටරියට බලහත්කාරයෙන් බඳවා ගැනීම යලි පන ගන්වනු ලැබීමට ද්විපාර්ශ්වික උත්සාහයක් දියත් කිරීම බොහෝ විට සිදු විය හැකි ය. එක්සත් ජනපද අධිරාජ්‍යවාදී ආධිපත්‍යය සඳහා වූ ඊනියා "දීර්ඝ යුද්ධය"දියත් කිරීම සඳහා සූදානම් කෙරෙන විශේෂ බලකායට මෙම තරුන ජනයා ඇද දැමෙනු ඇත.

යුද්ධයට එරෙහි අරගලය ඉදිරියට ගෙන යා හැක්කේ, ග්‍රහ ලෝකය මත ආධිපත්‍ය දරන ගෝලීය මූල්‍ය හා කොපරේට් අවශ්‍යතාවන්ට එරෙහිව පොදු අරගලයක් සඳහා, සෑම රටකම කම්කරුවන්ගේ ජාත්‍යන්තර ඒකාබද්ධතාවය ඉල්ලා සිටින සමාජවාදී වැඩ පිලිවෙලක් මත ස්වාධීනව දේශපාලනිකව බලමුලු ගැන්වීමෙනි. සමාජවාදී සමානතා පක්ෂය 2006 දී මැතිවරනයට ඉදිරිපත් වන්නේ එවන් විකල්පයක් ඉදිරිපත් කිරීම සඳහා ය.

© www.wsws.org